# පහන් වැට

## වෙන්ව ගිය පියාණෙනි

අරලිය මල් ඇතිරිල්ලේ
උරතලයේ තරු එළියේ
හඳහාමිගේ කතන්දරේ
අද වාගෙ මතකයි මට
පියාණනේ...

කිරියි පැණියි ගෙනත් දුන්නේ
හඳහාමී නොවෙයි හැබැයි
නුඹේ දෙපා ගෙව්ච්ච හැටි
මහ පොළවත් සාක්කියට
හෙළු දහඩිය කිරි නූනත්
කිරි අම්මා වූවා ඔබ
පියාණනේ...

ජීවිතයම ඔබ අභියස
වාන් දන ගඟක් අපට
නිහඬ වෙච්ච ඔබෙ පාමුල
කුඹය කැඩුණු රුවල් නැවක්..

පොඩි මල්ලී කඩුල්ල ළඟ
ගුරුපාරේ නුඹ එනකම්
දෙනෙත් කෙවෙනි බොඳ වීලා
නුඹේ සුවඳ තුරුළු කරන්

ජයසිරිමහ බෝ සමිඳේ
ගිය පෝයට මම පැතුවේ
සංසාරේ හැම බවයෙම
මගේ පියා වෙන්නයි ඔබ.."

**-පුෂ්පිකා ගමගේ-**
රොක්ස්බර්ග් පාර්ක්

## කියන්නෙමි ආදරෙන්

ලොවේම තනිවූ පුංචි කැදැල්ලක
දිවියේ ඇරුණළු පැහැය දකින්නට
මවත් පියත් ඔබ ලොවට ගෙනෙන්නට
පෙරුම් පිරූ හැටි ඔබ දන්නවනම්ල
ඇයයි අපේ ලොවහිරුත් ලසඳුන් බව
පුංචි කදුවට මගේ හැඟුනාවත්දෝ
සුසිනිඳු මොළකැටි දෑතම ගුළිකර
සිනාසුනා ඔබ විදා නල් නුවන්ල
කඳුළු බිඳුවක් කොපුල් තලමත
ගලායන්නට ඉඩනොදුන්නෙමු
පුංචි සුරඟන ලෙස දුටුව ඔබ
දෙපා නැගුවා වීරියෙන්ල
දැනමුතුවන්ගේ විසල් ලෝකයට
හිනැහි පිය නගනා සියුමැලියේ
ලෝකය රුදුරයි අනුකම්පා නැහැ
ගිනැහෙනමුත් ඔබ පිළිගනිමින්ල
අම්මයි තාත්තයි ඔබගැන සිතමින්
අහස් මාළිගා ගොඩනංගන්නේ
අපගේ ජීවිත වෙර නැතිවුනදා
අයදින්නේ නැගැ ඔබේ මෙහෙයන්ල
එපා දියණියේ හැර්බලන්නට
ඔබ ආ මග මල්පෙති අතුරා නැති
යන මග විලියයි එපා තැවෙන්නට
අපේ පැතුම් ඇත ඔබ වෙනුවෙන්ල

**ධර්ම කේ කොඩිප්පිලි**

## දඟකාර ජෝඩුවක්

දිරච්ච ජනේලයෙන් මා දැක්කේ
පිපුණ මලක් වැනි
පැහැපත් තරුණ දැරියක්
තද වැස්සේ එකිනෙකාට හැප්පෙමින්
පෙම්වතා සමඟ බොරළු පාරේ යන
සැටියි..

තද වැස්ස මුස ගනඳුර
හදවත මගේ වෙළා ගත්තද
ඉඳහිට දෙපස එළි කරන
විදුලිය මෙන්
දඟකාර ජෝඩුව
ප්‍රබෝධ කළා හදවත මගේ දිරාගිය..

මතකය මා ඇද ගියේ දුර අතීතයටයි
එදා මා හැසුරුණු අන්දම
ඉඳුරාම වෙනස්ය දැන්
පිරිහුණු සුචරිතයද?
නැත්නම් දුශ්චරිතයද?
ප්‍රහේළිකාවක් වීය මට..

මෙහොතකින් තේරුම් ගියා
ජීවය පිරී ඉතිරී යන බඳුන් ලෙස
හැසිරෙන පෙම් යුවළ..

තරුණ විය ඉක්මවා තනිකඩව
හිරිකඩ වැදී සීතලෙන් ගැහෙන මට
ඒ ජීවිතයට යළි යා හැකිදෝයි
බදා ගත්තා මගේ ගැහෙන හද..
සොබා දම මෙයද?

**මාතු එච්. ලියනගේ**
ද.ඕස්ට්‍රේලියාව

## වසරකට පෙර අවුරුද්දා මා හැර ගිය අම්මාට

අවුරුද්දේ කොහො නාද
නුඹේ කනට ඇහෙන්න ඇති
දෑස පියන් සිටියත් නුඹ
අවුරුදු බව දැනගන්නැති
නව වසරේ සතුටුවෙන්න
හිතේ හයිය තියෙන්න ඇති
ඒ විතරක් මදියි කියලා
නුඹේ ඉරණම කියන්න ඇති
::::::::::

බුලත් වැලේ දළුකොළ ටික
බලා සිටී නුඹ එනතුරු
බෙලි ගස්යට මල් වැටිලා
ලත වෙනවා නුඹ
එනතුරු::::::::::::::::::::

බුදු පහනත් නිවී ගිහින්
කුඹී දැල්ල වටකරගෙන
අවසන්වර පිදූ මල් මිට
කරවීලා බුදු හිමි
ළඟ::::::::::::::::::

නිමා නොකල රේන්දයක්
තැටි කටුවේ දැවටීලා
සිල් රෙදි ටික ඉහ ඉද්දර
වෙසක් එකට
සිල්ගන්නට::::::::::::::::::

මා එවූ ලිපි සියල්ලක්ම
නිදන ඇඳේ මෙට්ටය යට
නිතර අරන් කියවන්නැති
දූ දරු මුනුබුරන්
විත්ති::::::::::::::::::

පුළුවන්නම් නිරෝගීව
එන්න යළිත් අපි අතරට
අසනීපව එන්න එපා
දුකයි අපට බලා ඉන්න

නිවන් දකින්නටයි කියා
පතන්නේ නැහැ කවදවත්
ඉපදී නැවතත් මනුලොව
මගේ ආදර අම්මා වෙන්න

**අශානි පතිරණ**
බ්‍රිස්බේන්

## අයියණ්ඩී නුඹ එනතුරු

අප්පච්චිගෙ අම්මාගේ දෙපා පතුල්      සිඹ
පාර දිගේ පසු නොබලා එදා ගියේ      නුඹ
හැමදාමත් එක වගේම ඉඳිමුය කී      නුඹ
කවදාවත් නොඑන දුරක ඇදුණා      නොකියම

හඳපානේ වැව් ඉවුරේ ඔරුකඳ උඩ      ඉඳ
තරු යායට කිති කැව්වේ නුඹේ වස්දඬු      නද
බැත නෙළුමේ අඬහැරයට නුඹ කී      සීපද
මඳ පවනේ හෙමින් සැරේ ගමට      කියනවද

පිල් කණ්ඩිය බදු අරගෙන අප්පච්චී      ඇත
කතා නැතත් ගලක් නොවෙයි උන්දෑගේ      හිත
දුක් වැස්සට වාන් දමන අම්මාගේ      නෙත
දරු කැක්කුම කරල් වැදී සරසයි      පිංකෙත

රට වෙනුවෙන් අපි වෙනුවෙන් නුඹ දිවි දුන් කොට
මහ ගෙදරින් දීග යන්ට හිතක් නැතිය      මට
හැම රෑකම දකින එකම හීනෙ එකළු      කොට
අයියණ්ඩියෙ රජෙක් වගේ පායාපන්      ගෙට

**ශ්‍රියා කුමාරසිංහ**
නවසීලන්තය

## කළු - සුදු - තළෙළු

ඇඟත් නැත - මොළෙත් නැත
වැඩත් නැන - සුදුත් නැත
උපයනා තුට්ටු දෙක
ගිනි වතුරෙ තම්බලා
විස දුමෙන් දවාලා
සුසුම් හෙලති ඉතින්
මීහරක් කම්කරුවො
ඇඟ වේවි කළ ගෙඩිය
අල ගෙඩිය සේ දිසෙන
හිස තුළ වූ මොළ ගෙඩිය
අට පාස් සුදුම සුදු
කිරි කොක්කු වැඩක් නැති
සල්ලි මිටි කා දමන
මී හරක් ධනපතියො
දවස ගානේ වැරින්
වෙහෙසිලා උපයනා
සොච්චමෙන් කරවනා
දහසකුත් මන්දිර
මොළ ගෙඩිය ලොකු නිසා
තැවෙති උන් හැම දාම
තළ එලලු පැහැ දරන
මැද පෙළෙහි සිහිනයන්
කළු ජන බලය
සුදු රකින ධන බලය
තළෙළු පැහැ වුන් රකින
ආයුධය මොළ බලය

තරංග ජයසේන

## ඈවසානය

ජර්මානු ජාතික මාටින් නීමොලර් පාස්ටර්තුමා විසින්
හිට්ලර්ගෙ නාසි කණ්ඩායම් පිළිබඳව ලියන ලද First they came නැමැති සුප්‍රසිද්ධ කවියේ ඡායානුවාදයකි.

පළමුව ඔවුන් ආවෝ මරණට සැරසී
-කොමිනිස්ට්" කාරයින් රංචුව දස වදදී
මුනිවත රැකිම් නොම ගෙන කරදර සිතටා
-කොමිනිස්ට්" කාරයෙක් නොවෙමිය කිසිදු

දෙවනුව ඔවුන් ආවෝ ගිනි අවි රැගෙන
මරණට මානසික ආබාධැති පිරිස
කිසිවක් නෙදෙඩුවෙමි ඒ ගැන මම මුවිනි
රෝගාබාධ මා මනසේ නැති බැවිනි

තෙවනුව ඔවුන් මැරුවෝ හිත්පිත් නැතුව
යුදෙව් ජන පිරිස්ලොකු පොඩි අඩු නැතුව
කුමකට විමසම්ද මා ඒ ගැන ඉතින
යුදෙව්වෙක් නොවෙමි මා එය දැන ගනුව

ඉන් පසු මරා දැම්මෝ ඒ වදක කැළ
අදහන කතෝලික ආගම සියළුදෙන
මුවින් නොබැන සිටියෙමි මා සැනසිල්ලේ
ප්‍රොතෙස්තන්ත දහමය මා අදහන්නේ

අවසන ඔවුන් ආවෝ මා සොයා ගෙන
මරණ සහතිකයෙ මගෙ දින දමාගෙන
කිසිවෙකු සිටියෙ නැත ඒ බිහිසුණු දිනයේ
මා ගැන හඬක් නැගුමට මේ මිහිතලයේ

අනුවාදය: රසික සූරියආරච්චි
පෙන්රිත්

## අම්මේ!

වෙනදා මෙන් මලින් නොපිරුණු
කොවුලන්ට ගී ගයන්නට
අමතක වුණු
මේ ද බක් මාසයයි
ඔබේ ගුණ සුවඳ විතරක්ම ඉතිරි කර
නොඑන්නට යළි
අතැර ගිය බව
අපට පසක් කර දුන්
2006 බක් මාසයේ
නවවැනිදා උදෑසනක්
කිසිදක යළි නොඑන්නා සේම
ආදරෙන් අප තුරුළු කරගන්නට
කවදකවත් ඔබ නොආවත්
මේ ද බක් මාසයයි
අප සඳ තනිකර
කඳුළ පමණක් උරුම කරදුන්...

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය

කියවන්න.. ලියන්න..
තොරතුරු දැනගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න.
ඔබේ අදහස් සහ නිර්මාණ වෙනුවෙන් කැටපත් පවුරෙන් ඉඩක්.

සැබෑ මිතුරා වනාහි සියළු දෙනාම පිටව යද්දී දොරටුවෙන් ඇතුළු වන කෙනාය.
-පිල් මැග්‍රෝව්-